# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1659/15 - 2010 ජූනි 22 වැනි අඟහරුවාදා - 2010.06.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

මිය යාම හේතු කොටගෙන අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

මොහමඩ් අබුබකර් අච්චිමොහමඩ් නම් වූ සභිකයා අයත් වන ජාතික කොංග්‍රසය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත් වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65 අ (2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙකු වන මීරා සාහිබු රිජ්කාන් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී එම්. එම්. එස්. කේ. බණ්ඩාර මාපා වන මම, ( 262 වැනි අධිකාරය වූ ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, මීරා සාහිබු රිජ්කාන් මහතා අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එම්. එම්. එස්. කේ. බණ්ඩාර මාපා,
තේරීම්භාර නිලධාරී,
අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාව.

2010 ජූනි මස 07 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
අම්පාර.

07-244

1A - G 13021 — 390 (2010/06)

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ ඉමදූව ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

දකුණු පළාතේ පළාත් සභාවට තේරී පත් වීම හේතු කොටගෙන ඉමදූව ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65 අ (1) වගන්තිය යටතේ, සභාපති වන ජයවික්‍රම කංකානම්ගේ ධර්මරත්න ජයවික්‍රම නම් වූ සභාපති අයත්වන එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ, පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට, දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභාපති වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, ඒ ඉමදූව ප්‍රාදේශීය සභාවේ සභිකයා පිළිබඳ තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා අහංගම විතානගේ සරත් කුමාර මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

ඉමදූව ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී අන්තෝනි බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, අහංගම විතානගේ සරත් කුමාර මහතා ඉමදූව ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ඒ. බී. අයි. ද සිල්වා,
තේරීම්භාර නිලධාරී,
ඉමදූව ප්‍රාදේශීය සභාව.

2010 ජුනි මස 09 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
ගාල්ල.

07-245

---

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ ඉමදූව ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

දකුණු පළාතේ පළාත් සභාවට තේරී පත් වීම හේතු කොටගෙන ඉමදූව ප්‍රාදේශීය සභාවේ සභිකයෙකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ජයවික්‍රම කංකානම්ගේ ධර්මරත්න ජයවික්‍රම නම් වූ සභිකයා අයත්වන එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ, පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට, දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, ඒ ඉමදූව ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තකු නාමයෝජනා කිරීමට ඉහත කී ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තකු වන රත්නසිරි කිතුලම්පිටිය කෝරළේගේ මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉමදූව ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී අන්තෝනි බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, රත්නසිරි කිතුලම්පිටිය කෝරළේගේ මහතා ඉමදූව ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ඒ. බී. අයි. ද සිල්වා,
තේරීම්භාර නිලධාරී,
ඉමදූව ප්‍රාදේශීය සභාව.

2010 ජුනි මස 09 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
ගාල්ල.

07-246

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වැනි වගන්තිය යටතේ දැන්වීම

### කුරුණෑගල ප්‍රාදේශීය සභාව

කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ සභිකයකු වන දුමිඳු ගාර්දියේ පුංචිහේවා මහතා එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයකුව සිටීම අවසන් කර ඇති නිසා, එම සභාවේ ඔහුගේ සභික ධුරය ඔහු විසින් අතහැර ඇති බව කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි රත්නායක මුදියන්සේලාගේ ආනන්ද ලොකුබණ්ඩාර රත්නායක වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10 අ (1) (අ) වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

ආර්. එම්. ඒ. එල් රත්නායක,
තේරීම්භාර නිලධාරි,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව.

2010 ජූනි මස 15 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
කුරුණෑගල.

07-247

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.